# ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපන ප්‍රවේශය පිළිබඳ හැඳින්වීමක්

මඩුගල්ලේ සුදත්ත හිමි

## හැඳින්වීම

මනා පෞරුෂයකින් යුක්ත දරුවෙකු බිහි කිරීම අධ්‍යාපනයේ මූලික අභිප්‍රායක් වන අතර එය සාධනය කිරීමෙන් සමාජ පද්ධතිය, දේශපාලනය, ආර්ථික උරුමය ආරක්ෂා කිරීමට හැකි වේ. ඒ සඳහා පාසල නම් අධ්‍යාපන ආයතනය සියලු ම සමාජයන් හි හිතාමතා ම නිර්මාණය කරමින් එම අභිප්‍රාය විෂයෙහි උත්සුක වේ (Inuwa & Yusof, 2013). ඒ අනුව නිසි ආකාර වූ අධ්‍යාපනයක් ක්‍රියාත්මක කිරීමෙන් සමාජයීය, ආර්ථික, දේශපාලනික, සංස්කෘතිකමය ආදි ලෙසින් සර්ව සම්පූර්ණ සංවර්ධනයක් රටක ඇති කළ හැකි වේ. එම නිසා අධ්‍යාපන රටාවෙන් නිර්මාණය වන දරුවා ඉතා සැලසුම් සහගතව නිර්මාණය කළ යුතු ය. ඒ සඳහා භාවිත කළ හැකි අධ්‍යාපන ප්‍රවේශ කිහිපයකි.

- ගුරු කේන්ද්‍රීය අධ්‍යාපනය
- සමාජ කේන්ද්‍රීය අධ්‍යාපනය
- ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපනය
- සංවර්ධන කේන්ද්‍රීය අධ්‍යාපනය

මෙම ක්‍රම අතරින් ශිෂ්‍යයෙකු නිර්මාණය කිරීම සඳහා අතීතයේ දී යොදාගත් ක්‍රමය වූයේ ගුරුවරයා ප්‍රධාන වූ ගුරු කේන්ද්‍රීය අධ්‍යාපනයයි. එහිදී ගුරුවරයාගේ දැනුම ශිෂ්‍යයාට සම්ප්‍රේෂණය කරන අතර ශිෂ්‍යයා එම දැනුම අක්‍රීය ලෙසින් ග්‍රහණය කර ගැනීමට පෙළඹෙයි. මෙම අක්‍රීය ඉගෙනුම් ක්‍රමය වෙනුවට දාර්ශනිකයන් ශිෂ්‍යයා ප්‍රධාන වූ අධ්‍යාපන රටාවක් පිළිබඳ කරුණු දක්වා ඇත. එය ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපනයයි. ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේ හැරවුම් ලක්ෂයක් ලෙස පෙන්වා දිය හැකි මෙය ලොව පුරා ඉතා

ප්‍රචලිතම අධ්‍යාපන ක්‍රමය ලෙස සියලු ම රටවල්වල පාහේ අධ්‍යාපන පද්ධතීන් හි භාවිත කරනු ලබයි. මෙම ලිපිය තුළ දී ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපනය යන්න හඳුනා ගනිමින්, එහි ආරම්භය හා පරිණාමය විමසීමටත්, ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපනයක ප්‍රධාන ලක්ෂණ ඉදිරිපත් කිරීමටත් බලාපොරොත්තු වේ.

**ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපනය හැඳින්වීම**

ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපනය, ශිෂ්‍ය කේන්ද්‍රීය ඉගෙනුම, ඉගෙනුම් ලාභියා කේන්ද්‍රීය ඉගෙනුම, නම්‍යශීලි ඉගෙනුම, අත්දැකීම් සහිත ඉගෙනීම, ස්වයං අධ්‍යක්ෂණ ඉගෙනීම ආදි විවිධ නම්වලින් මෙම ප්‍රවේශය හඳුන්වන අතර වඩාත් ප්‍රචලිතව භාවිත වන්නේ ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපනය (Student Centerd Learning) යනුවෙනි (Neill and Mcmahon, 2005). මෙලෙස විවිධ නාමයන් භාවිත වන නිසා ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපනය පිළිබඳ විවිධ නිර්වචන රාශියක් ඉදිරිපත් වී ඇත. ඒ සඳහා එක් පිළිගත් නිර්වචනයක් සැපයීම අපහසුය. එසේ වුව ද විවිධ දාර්ශනිකයන්ගේ සහ අධ්‍යාපනඥයන්ගේ මතවාද ඇසුරින් ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපනය පිළිබඳ මූලික අවබෝධයක් ලබාගත හැකි ය.

ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපනය යනු එක් එක් ශිෂ්‍යයෙකුගේ අවශ්‍යතාවන් සාධනය වන පරිදි සකස් කර ඇති දර්ශනයක් හෙවත් ප්‍රවේශයකි. ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපනය පිළිබඳ දාර්ශනිකයන් අධ්‍යාපනඥයන් නිර්වචන ඉදිරිපත් කර ඇති අතර අධ්‍යාපන දාර්ශනිකයන් ස්වකීය දර්ශනයන් තුළින් මෙම ප්‍රවේශය දැඩි ලෙස අවධානයට ලක් කර ඇත.

ඒ අතර ප්‍රමුඛයෙක් වන ජීන් ජැක්ස් රූසෝ දක්වන්නේ,

''ඔබේ ශිෂ්‍යයාට දේශන පාඩම් ඉදිරිපත් නොකරන්න. ඔහුට උගැන්විය යුත්තේ අත්දැකීම් තුළින් පමණකි. තමා ම ඉගෙන ගන්නවා මිස, ඔබ ඔහුට උගැන්වීම නිසාම කිසිවක් උගෙනුමට ඔහුට ඉඩ නොතබන්න. ඔහුට විද්‍යාව උගැන්වීමක් නොකරන්න. ඔහුට එය සොයා ගැනීමට ඉඩ දෙන්න (නානායක්කාර, 2008).'' යනුවෙනි. ඒ අනුව ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපනයේ දී ගුරුවරයාගේ කාර්යය අවශ්‍ය

අත්දැකීම් ලබා ගැනීම සඳහා අවස්ථා සලසා දීම පමණකි. ශිෂ්‍යයා ඉගෙනීමේ ප්‍රධාන විය යුතු මෙන් ම ක්‍රියාකාරී ද විය යුතු අතර ඔහුට අත්දැකීම් ඇසුරෙන් ඉගෙනීමේ අවස්ථාව සහිත ඉගෙනුම් පරිසරයක් ද නිර්මාණය කළ යුතු ය.

ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපනය පිළිබඳ විශේෂ අවධානයක් යොමු කළ දාර්ශනිකයෙකු වන කොමිනියස් දක්වන්නේ, 'වචන මාර්ගයෙන් ඉගැන්වීමට වඩා ඉන්ද්‍රීය මාර්ගයෙන් ඉගෙනුමට ඉඩ දිය යුතු ය. ස්වභාවධර්මය හොඳම ගුරුවරයා වේ' (ජාතික අධ්‍යාපන ආයතනය, 2010) යනුවෙනි. ඒ අනුව ගුරුවරයා ප්‍රධාන වී පැවති අධ්‍යාපන ක්‍රමය වෙනුවට ශිෂ්‍යයා ප්‍රධාන වූ අධ්‍යාපන ක්‍රමයක් ඔහු අවධාරණය කරයි. මෙලෙසින් දාර්ශනිකයන් තම දර්ශනයන් හරහා ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපනයක අවශ්‍යතාව දක්වා ඇති අතරම විවිධ අධ්‍යාපනඥයන් ද මේ පිළිබඳ අදහස් දක්වා ඇත.

ෆැරන්ට් (1964) ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපනය නිර්වචනය කර ඇත්තේ පහත ආකාරයෙනි.

''ළමයා කේන්ද්‍ර කරගත් අධ්‍යාපනය යනු ළමා සංවර්ධනයට, ළමා අවශ්‍යතාවන්වලට සහ ලක්ෂණවලට ගැළපෙන පරිදි, පාසල් විෂය අන්තර්ගතය හා ක්‍රමවේද සකස් කර ගන්නා පාසල් අධ්‍යාපනය සඳහා යෙදෙන නාමයකි.''

ඒ අනුව ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපනයක දී සිසු අවශ්‍යතාවන් හා ශිෂ්‍ය විවිධත්වයට හෙවත් ලක්ෂණවලට ගැළපෙන ලෙස ඉගැන්වීම් ක්‍රමවේද මෙන් ම විෂයමාලාවන් ද සකස් විය යුතු ය.

ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපනයේ මූලික ලක්ෂණ අන්තර් ග්‍රහණය කරමින් ග්‍රීන් සහ හැරින්ටන් (2020) ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපනය පහත ආකාරයෙන් නිර්වචනය කරයි.

''සැබැවින්ම ශිෂ්‍ය කේන්ද්‍රීය ඉගෙනුම් පරිසරයක් තුළ ගුරුවරුන් හා සිසුන් එක් එක් ඉගෙන ගන්නන්ගේ අවශ්‍යතා සඳහා වඩාත් ගැළපෙන ඉගෙනුම් සැලැස්මක් නිර්මාණය කිරීමට සහයෝග යෙන් කටයුතු කරයි. ශිෂ්‍ය කේන්ද්‍රීය ඉගෙනුම් පරිසරයක් තුළ

ගුරුවරයා සෑම සිසුවෙකුගේ ම අවශ්‍යතාවන් සඳහා පෞද්ගලික පරිසරයක් නිර්මාණය කිරීමට උපකාර කරයි. සෑම සිසුවෙකුගේ ම ඉගෙනීමේ අත්දැකීම්වල ගෘහ නිර්මාණ ශිල්පියෙකු ලෙස සේවය කරයි.''

ඉහත දක්වා ඇති පරිදි ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපන රටාවේ දී ශිෂ්‍ය අවශ්‍යතා සම්පූර්ණ වන ආකාරයෙන් කටයුතු කිරීම සිදු වන අතර ඒ සඳහා අවශ්‍ය මග පෙන්වීම හා සහයෝගය ලබා දීම ගුරුවරයා විසින් සිදු කළ යුතු වේ. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී ගුරුවරයා ප්‍රධාන නොවන අතර සෑම සිසුවෙකුගේ ම අත්දැකීම්වල සැලසුම් කරන්නා ලෙස, ගෘහ නිර්මාණය කරන පුද්ගලයෙකු ලෙසින් සැලසුම් කිරීම පමණක් සිදු කරයි.

ඒ අනුව ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපනය යනු ශිෂ්‍ය විවිධත්වයට මූලිකත්වය දෙමින් ඔවුන්ගේ අවශ්‍යතා සලකා බලමින් සකස් කරන ලද අධ්‍යාපන ප්‍රවේශයකි. එහි ශිෂ්‍යයා ක්‍රියාශීලිව අත්දැකීම් ඇසුරින් අධ්‍යාපනය ලබා ගනු ලැබේ. ගුරුවරයා අවශ්‍ය මග පෙන්වීම පමණක් සිදු කළ යුතු වේ.

**ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපන ක්‍රමයේ ආරම්භය හා පරිණාමය**

ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපනයේ මූලාරම්භය ක්‍රි.පූ. 6 වැනි සියවස දක්වා ඈත අතීතයට ඇදී යයි. අතීතයේ ආගමික මතවාද සමග පූජක පංතියේ ඒකාධිකාරයක් ලෙස දැනුම පැවතිණි. එම දැනුම මිනිසුන් විසින් වෙනස් නොකළ යුතු දේව භාෂිතයක් ලෙස පිළිගත් අතර ම එය සම්ප්‍රේෂණය කිරීම පූජක පංතිය විසින් සිදු කරන ලදී. එහිදී ගුරුවරයා විසින් දේශනයක් විලාශයෙන් එම ඉගැන්වීම් ශ්‍රාවකයන්ට හෙවත් අනුගාමිකයන්ට ලබා දුනි. අනුගාමිකයන් ඒවා ඒ ආකාරයෙන් ම දේව භාෂිතයක් මෙන් පිළිගත්හ. ඒ ගුරු කේන්ද්‍රීය අධ්‍යාපනයයි. ඉන්දියාවේ වෛදික, බටහිර ක්‍රිස්තියානි, මැද පෙරදිග ඉස්ලාමීය, පර්සියාවේ සරතශ්‍රීය හා පැරණි චීන ආදි සම්ප්‍රදායන් තුළ මෙම ලක්ෂණ දක්නට හැකි ය (නානායක්කාර, 2008).

මෙලෙස පැවති ආගමික පසුබිම තුළ මුලින් ම ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපනයක ලක්ෂණ දක්නට ලැබෙන්නේ වෛදික යුගයේ පශ්චිම භාගයට අයත් උපනිශද් දර්ශනය (ක්‍රි.පූ. 800-600) තුළ ය. වෛදික යුගයේ පවත්වා ගෙන ආ දැනුමෙන් සෑහීමකට පත් නොවූ උපනිශද් ආචාර්යවරු ස්වයං චින්තනය මෙහෙයවා යථාර්ථය අවබෝධ කර ගැනීමට උත්සාහ ගෙන ඇත. ඔවුන්ගේ ශිෂ්‍යයන් ද ඒ මග ම යවමින් ප්‍රායෝගිකව තම තමන් විසින් සත්‍ය අවබෝධ කරගත යුතු බව දක්වමින් ඒ සඳහා යොමු කරන අවස්ථාවන් හඳුනාගත හැකි ය. එවැනි අවස්ථා ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපනික ලක්ෂණ සේ හඳුනාගත හැකි අතර ඒ මෙම සංකල්පයේ පැරණි ම සාධක සේ දැක්විය හැකි ය.

එම උපනිෂද් දර්ශනයේ උත්තුංග ඵලය ලෙස සැලකෙන ක්‍රි.පූ. 6 වන ශත වර්ෂයේ උත්තර භාරතයේ ගෞතම බුදුන් වහන්සේ විසින් ඉදිරිපත් කරන ලද බෞද්ධ දර්ශනය තුළ ද ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපනික ලක්ෂණ හඳුනාගත හැකි ය. උන්වහන්සේ ධර්මය ශ්‍රාවකයන්ට ඉගැන් වූ ආකාරය තුළින් එවැනි ලක්ෂණ රාශියක් හඳුනාගත හැකි ය. 'තමාගේ විමුක්තිය තමා ම සලසා ගත යුතු ය (ධම්මපදපාළි, ආත්ම වග්ගය, 2006)', 'බුදුන් වහන්සේ සිදු කරනුයේ මග පෙන්වීම පමණකි. ඔබ විසින් එම මග පිළිපැදිය යුතු ය (ධම්මපදපාළි, මග්ග වග්ගය, 2006)', 'තමාට පිහිට තමා ම ය (ධම්මපදපාළි, ආත්ම වග්ගය, 2006)'. බෞද්ධ සාහිත්‍ය පුරාවට ම මෙවැනි ලක්ෂණ බහුලව හඳුනාගත හැකි ය. මෙලෙසින් පෙරදිග ලෝකයේ ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපනයේ අරුණලු වෛදික යුගයේ සිට දැකිය හැකි ය.

අපරදිග ලෝකයේ මෙම ලක්ෂණ හඳුනාගත හැක්කේ ග්‍රීක ශිෂ්ටාචාරය තුළ බිහි වූ සොක්‍රටීස්, ප්ලේටෝ හා ඇරිස්ටෝටල් යන දාර්ශනිකයන්ගේ අධ්‍යාපන චින්තනයන් තුළිනි (නානායක්කාර, 2008). මොවුන් විසින් අනාවරණ ක්‍රමය, සාකච්ඡා ක්‍රමය, සංවාද ක්‍රමය වැනි ක්‍රම උපයෝගී කර ගනිමින් ශිෂ්‍යයාට ප්‍රමුඛ ස්ථානය ලබා දී ඉගෙනීමට යොමු කිරීම හරහා ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපනයකට යොමු වූ නමුත් ඔවුන්ගේ එම ප්‍රවේශයෙන් පසු නැවත බටහිර ලෝකයේ වනපොත්කරණයට මුල් තැන ලැබීමෙන් එවැනි ක්‍රම යටපත් විය. පෙරදිග ද බ්‍රාහ්මණ ඉගැන්වීම් ආශ්‍රය නිසා වනපොත්කරණය ප්‍රකට

ක්‍රමයක් ලෙස පවත්වා ගෙන යාමට උත්සාහ ගෙන ඇත. එම නිසා ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපනය යම් පසුබෑමකට ලක් විය.

ග්‍රීක යුගයෙන් පසුව ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපනයට මග විවර වන්නේ 14 වන සියවසේ අග භාගයේ පමණ ය. 'උගැන්වීම හා ශිෂ්‍ය කේන්ද්‍රීය ක්‍රමවේදය පිළිබඳ වැදගත් මූලික අදහස් රැසක් හෙළි කළ ඩේසිඩේරියස් ඉරාස්මස් (1466-1521) මේ පිළිබඳ නව චින්තනයක් සඳහා පදනම සකස් කළේය' (නානායක්කාර, 2008). යනුවෙන් දැක්වෙන පරිදි නූතන ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපනයට අවශ්‍ය පදනම සකස් කිරීම ඉරාස්මස් සිදු කර ඇති අතර ඉන් පසුව කමිනියස් (1592-1670) හා රූසෝ (1712-1778) ආදි දාර්ශනිකයන් විසින් එම මතය තවදුරටත් විග්‍රහ කර ඇත. රූසෝගෙන් පසු යුගයේ ජේ.එච්. පෙස්ටලොසි (1746-1828), එෆ්. ෆ්‍රිබල් (1782-1858), මාරියා මොන්ටිසෝරි (1870-1952), ජේ.එච්. හර්බර්ට් (1776-1841) වැනි දාර්ශනියන් එම ඉගැන්වීම් ප්‍රායෝගික ව යොදාගත් නිසා 'ප්‍රගතිශීලි අධ්‍යාපන ව්‍යාපාරය' නමින් ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපනය පිළිබඳ නව යුගයක් උදා විය (නානායක්කාර, 2008).

පසු කාලීනව ජෝන් ඩිවි (1869-1952) වැනි දාර්ශනිකයන් විසින් මෙම ක්‍රමය දැඩි ලෙස අවධාරණය කර ඇත. මෙම ක්‍රමය සාමාන්‍ය අධ්‍යාපනික න්‍යායයක් ලෙස සංවර්ධනය කිරීමේ ගෞරවය කාල් රොජස්ට (Carl Rogers) හිමි වේ (Neill and Mcmahon, 2005). එනමුත් පාසල් පද්ධතිය තුළ ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපන සංකල්පය ව්‍යුත්පන්න වී ඇත්තේ ෆ්‍රොයිබෙල්ගේ කෘතියකිනි. ඒ 'සංතෘප්තියේ ක්‍රියාවලියට බාධා නොකළ යුතු ය. එහෙත් මග පෙන්වීමක් ලෙස ක්‍රියා කළ යුතු ය.' යන අදහස පාදක කරගෙන බව සයිමන් (Simon, 1999) දක්වයි.

මෙලෙස ක්‍රි.පූ. 6 වැනි සියවසේ පමණ සිට ක්‍රමානුකූලව සංවර්ධනය වූ ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපනය නූතන අධ්‍යාපන පද්ධතියේ ප්‍රධාන ම අධ්‍යාපන ප්‍රවේශය ලෙස භාවිත කරයි. ඉගැන්වීම, විෂයමාලාව, ඇගයීම වැනි සියලු ම අංගවලට මෙහි සෙවනැලි වැටී ඇත. දාර්ශනිකයක් විසින් දක්වා ඇති ලක්ෂණ අනුව අධ්‍යාපන පද්ධතිය ම ශිෂ්‍ය කේන්ද්‍රීය බවට පත් කිරීමේ නැඹුරුව 21 වන

සියවසේ දී දැඩිව සාකච්ඡාවට ලක් වේ. ඒ අනුව නූතනයට උචිත ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපන පද්ධතියක් සඳහා සැලසුම් සකස් කර ඇත.

**ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපනයේ මුඛ්‍ය ලක්ෂණ**

ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපනයේ මූලික ලක්ෂණ 4ක් ග්‍රීන් සහ හැරින්ටන් (2020) දක්වා ඇත.

I. හඬ (Voice)

II. තේරීම (Choice)

III. නිපුණතා මත පනදම් වූ ප්‍රගතිය (Competency-based progression)

IV. ශිෂ්‍ය අවශ්‍යතා අඛණ්ඩව අධීක්ෂණය කිරීම (Continuous monitoring of student needs)

සැබැවින් ම ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපනයක් සහිත පරිසරය තුළ ශිෂ්‍යයාගේ හඬට හා තේරීම්වලට විශේෂ අවකාශයක් තිබිය යුතු ය. ශිෂ්‍යයා තමාගේ අවශ්‍යතාව හා හැකියාව අනුව එම තෝරා ගැනීම සිදු කරන අතර ඔහුගේ හඬට ගුරුවරයා ඇහුම්කන් දිය යුතු ය. ඉගෙනීම පිළිබඳ ප්‍රධාන තීරණ ගුරුවරයා සමග සාකච්ඡා කොට ශිෂ්‍යයා විසින් ගනු ලැබේ. එවැනි තීරණ පිළිබඳ ගිබ්ස් (1995) පහත කරුණු දක්වයි.

- ඉගෙන ගත යුත්තේ මොනවා ද?
- කවදා, කෙසේ ඉගෙන ගත යුතු ද?
- කුමන ඉගෙනුම්ඵල සමග ද?
- කුමන නිර්ණායක හා ප්‍රමිතීන් භාවිත කළ යුතු ද?
- විනිශ්චය කරන්නේ කෙසේ ද? සහ කවුරුන් විසින් විනිශ්චය කරන්නේ ද?

ආදිය පිළිබඳ තීරණ ගුරුවරුන් සමග කතා කරමින් සිසුන් ගන්නා පරිසරයක් ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපනයේ තිබිය යුතු ය.

එම නිසා අධ්‍යාපන ක්‍රමය, වතුර පිරුණු ජොග්ගුවකින් හිස් කෝප්පයක් පුරවන්නා සේ දැනුම නවකයා වෙත සම්ප්‍රේෂණය කරන ගුරු කේන්ද්‍රීය අධ්‍යාපනයක් නොවිය යුතු ය. 'සියල්ල දන්නේ ගුරුවරයා ය' යන මතය මෙහි දී ප්‍රතික්ෂේප වන අතර ශිෂ්‍යයා අදාළ නිපුණතා කරා ළඟා කර ගැනීමට මෙහෙය වීමක් පමණක් ගුරුවරයා සිදු කළ යුතු ය. එනම් විෂය අන්තර්ගතයට වඩා වැඩි අවධානයක් ක්‍රියාවලියට හා නිපුණතාවට ලබා දිය යුතු ය. ශිෂ්‍යයා අදාළ නිපුණතාය සාධනය කර ගැනීම මෙහිදී අර්ථවත් වේ. ගුරුවරයා නිතර ශිෂ්‍ය අවශ්‍යතා සොයා බලනවා සේ ම ඔවුන්ගේ ප්‍රගතිය පිළිබඳ ව ද අධීක්ෂණය කළ යුතු ය.

ලී ඇතුළු පිරිස (Lea et al. 2003) ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපනයක දැකිය හැකි ලක්ෂණ කිහිපයක් ඉදිරිපත් කර ඇත.

- නිෂ්ක්‍රීය ඉගෙනුමට වඩා සක්‍රීය ඉගෙනුම මත රඳා පැවතීම
- ගැඹුරු ඉගෙනීම හා අවබෝධය පිළිබඳ අවධානය
- ශිෂ්‍යයාගේ වගකීම හා වගවීම වැඩි කිරීම
- ඉගෙනගන්නන් තුළ ස්වයං පාලනය පිළිබඳ වැඩි හැඟීමක් පැවතීම
- ගුරුවරයා හා ශිෂ්‍යයා අතර අන්තර් සම්බන්ධය
- ගුරු-සිසු සබඳතා තුළ අන්‍යෝන්‍ය ගෞරවය
- ගුරුවරයා හා ශිෂ්‍යයා යන දෙපාර්ශ්වය ම ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියට නැඹුරු වීම

ඒ අනුව ශිෂ්‍යයා නිතර ම ක්‍රියාශීලී වන අතර ක්‍රියාකාරකම් පාදකව තම ඉගෙනීම සිදු කරයි. ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය පිළිබඳ වගකීම හා වගවීම ද ශිෂ්‍යයාට වැඩි වන නිසා ඉතා උනන්දුවෙන් යුතුව කටයුතු කරයි. ගුරු සිසු සබඳතා නිරන්තර වර්ධනය වන

අතර දෙපාර්ශවය ම අධ්‍යයන කාර්යයට වැඩි නැඹුරුවක් දක්වමින් අන්‍යෝන්‍ය සුහදත්වයෙන් කටයුතු කරයි.

තවද ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපනයක ලක්ෂණ කිහිපයක් හඳුනාගත හැකි ය.

- ශිෂ්‍යයා ඉලක්ක කර ගැනීම
- ශිෂ්‍ය මූලිකත්වය හා උගෙනුම් හැකියාව පිළිගැනීම
- සියලු ම සිසුන්ගේ ඉගෙනුම් අයිතිය පිළිගැනීම
- සිසුන්ගේ වෙනස්කම් පිළිගැනීම හා ඒවා හඳුනා ගෙන කටයුතු කිරීම
- ඉගෙනුම් ශෛලි පිළිබඳ වෙනස්කම් ගැන සැලකීම
- ළමා සංවර්ධන අවස්ථා ගැන අවධානය
- ජන්ම විභවතා ගැන සොයා බැලීම
- ඉගෙනුමට සූදානම් බව පිළිබඳ වෙනස්කම් ගැන සැලකීම
- ජීවත් වන පරිසරය හා අත්දැකීම්වල වෙනස්කම් ගැන සැලකීම (නානායක්කාර, 2008).
- ඕනෑම තැනක ඉගෙනීමේ හැකියාව
- ඉගෙනීමේ හා ඉගැන්වීමේ නම්‍යශීලි බව
- සමෝධානිත ඉගෙනීම
- විෂයමාලාව හා ක්‍රියාකාරකම් ඒකාබද්ධ කිරීම (Dahanayake, 2006).

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ පන්ති කාමරයේ දී සහ ඉන් පිටත දී මෙම ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපනය භාවිත කිරීම සඳහා පහත ආකාරයේ ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රම යොදාගත හැකි බව Neill and Mcmahon (2005) දක්වයි. ඒ අනුව පංති කාමරයෙන් පිටත දී භාවිත කළ හැකි ක්‍රම හා පංති කාමරය තුළ දී භාවිත කළ හැකි ක්‍රම ලෙස වෙන් වෙන්ව පහත දක්වා ඇත.

| පංති කාමරයෙන් පිටත | පංති කාමරය තුළ |
|---|---|
| නිදහස් ව්‍යාපෘති (Independent projects) | කුඩා කණ්ඩායම් ක්‍රියාකාරකම් (Buzz groups) (දෙදෙනා බැගින් සාකච්ඡා කිරීම) |
| කණ්ඩායම් සාකච්ඡා (Group discussion) | පිරමීඩ/ හිමබෝල කණ්ඩායම් (Pyramids/Snowballing) (කුඩා කණ්ඩායම් විශාල කණ්ඩායමක් සමග අඛණ්ඩව සාකච්ඡා පවත්වයි.) |
| අනෙක් සිසුන්ගේ සම පදස්ථ උපදේශනය (Peer mentoring of other Students) | සිසුන් කණ්ඩායම් අතර හුවමරු කිරීම (Cross-overs) (අකුරු හෝ අංක වෙන් කිරීම් අනුව සිසුන් කණ්ඩායම්වලට මිශ්‍ර කිරීම) |
| වාද විවාද (Debates) | වෘත්තාකාර කණ්ඩායම් Rounds (තනි සිසුන්ට කතා කිරීමට අවස්ථාව ලබා දීම) |
| ක්ෂේත්‍ර චාරිකා (Field trips) | ප්‍රශ්නාවලි (Quizzes) |
| ප්‍රායෝගික ක්‍රියාකාරකම් (Practicals) | ඉගෙනීම පිළිබඳ ප්‍රත්‍යවේක්ෂණ ලිවීම (මිනිත්තු 3/4 කාලයක දී) (Writing reflexions on learning (3/4 minutes) |
| ප්‍රත්‍යවේක්ෂණ දිනපොත් සහ ඉගෙනුම් සඟරා ලිවීම (Reflective diaries, Learning Journals) | පංති කාමර ඉදිරිපත් කිරීම් (Student class presentations) |
| පරිගණක ආධාරයෙන් ඉගෙනීම (Computer assisted learning) | භූමිකා රංගන (Role play) |
| අධ්‍යයන ව්‍යාපෘති සඳහා විෂයන් තෝරා ගැනීම (Choice in subjects for study/Projects) | පුවරු ඉදිරිපත් කිරීම (Poster presentations) |
| පුවත්පත් ලිපි ලිවීම (Writing newspaper article) | සංකල්ප සටහන් නිර්මාණය කිරීම (Students producing mind maps in class) |
| ඉගෙනීමට අදාළ ලිපි ගොනු සංවර්ධනය (Portfolio development) | |

මෙවැනි ක්‍රම ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපන ක්‍රමයක දී භාවිත කළ හැකි වේ. ඒ සියලු ක්‍රමවලින් ශිෂ්‍යයා ක්‍රියාශීලී ව කටයුතු කරන අතර අත්දැකීම් හා ගවේෂණ පාදක ව ඉගෙනීමට යොමු වේ. ගුරුවරයා අවශ්‍ය සුසාධ්‍යකාරක භූමිකාව පමණක් මෙහි දී සිදු කරයි.

**ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපන ක්‍රමයක භාවිත කළ හැකි තක්සේරු ක්‍රම**

ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපන ක්‍රමයේ දී ඉගැන්වීම, ඉගෙනීම මෙන් ම ඇගයීම ද ශිෂ්‍ය කේන්ද්‍රීය ව සිදු කළ යුතු වේ. එහිදී භාවිත කළ හැකි තක්සේරු ක්‍රම කිහිපයක් ගිබ්ස් (Gibbs, 1995) පහත පරිදි දක්වයි.

- දිනපොත්, ලඝු සටහන් හා සඟරා මගින් තක්සේරු කිරීම
- ලිපි ගොනු රචනය (Portfolios) මගින් තක්සේරු කිරීම
- සමපදස්ථ හා ස්වයං තක්සේරුව
- සාකච්ඡාමය තක්සේරුව
- ව්‍යාපෘති මගින් තක්සේරු කිරීම
- කණ්ඩායම් වැඩ මගින් තක්සේරු කිරීම
- කුසලතා හා නිපුණතා සොයා බැලීමෙන් තක්සේරු කිරීම

ඒ අනුව තක්සේරුකරණය ද ශිෂ්‍ය කේන්ද්‍රීය ව සිදු කළ යුතු ය. සාම්ප්‍රදායික ක්‍රමය මෙන් ලිඛිත විභාග පමණක් පැවැත්වීම සිදු කළ යුතු නොවේ. ක්‍රියාකාරකම් පාදක කර ගනිමින් ඇගයීම සිදු කළ යුතු අතර ශිෂ්‍යයා තෘප්තිමත් වන ආකාරයෙන් කටයුතු කිරීම ද මෙහි මූලික ලක්ෂණයකි.

**ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපනයක් පාසල් තුළ ක්‍රියාත්මක කිරීමේ අභියෝග**

පාසල්වල ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපන ක්‍රමයක් යොදා ගැනීමේ දී මුහුණ දීමට සිදු වන විවිධ අභියෝග රාශියක් හඳුනාගත හැකි ය. UNICEF (2019) මගින් සිදු කරන ලද පර්යේෂණ වාර්තාවක එවැනි

අභියෝග කිහිපයක් දක්වා ඇත. ඒවායේ ප්‍රධාන කාණ්ඩ පහත පරිදි ය.

- ප්‍රතිපත්ති වෙනස් කිරීම්වල දී යථාර්ථවාදී නොවන අපේක්ෂාවන් පිහිටුවා තිබීම
- ප්‍රතිපත්ති වෙනස්කම් පිළිබඳ තොරතුරු බෙදා හැරීමේ දුර්වලතාව
- ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියට අවම සූදානම - නිදසුනක් වශයෙන්, කෙටි වැඩමුළුවක් හරහා ගුරුවරුන් තම දිගුකාලීන භාවිතය වෙනස් කිරීමට අපේක්ෂා කිරීම
- අඩු ගුරු පුහුණුව හා අධ්‍යාපන ශික්ෂණ විද්‍යා දැනුම අඩු වීම
- ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපනය පිළිබඳ ව උගන්වන නමුත් එය ආදර්ශයට ගැනීමට ගුරුවරුන් සූදානම් නොවීම
- ඉගැන්වීම් ද්‍රව්‍ය හා සම්පත් හිඟය
- විශාල පන්ති ගණත්වය සහ ජනාකීර්ණ ස්වභාවය
- විභාග පාදක අධ්‍යාපනය
- ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපනය සඳහා සහාය නොදක්වන කළමනාකරණ සහ පරීක්ෂණ පාලන තන්ත්‍ර (UNICEF, 2019)

මෙම සාධක ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපනයක් ක්‍රියාත්මක කිරීමට අභියෝග ලෙස හඳුනාගත හැකි ය. සාම්ප්‍රදායික අධ්‍යාපන රටාව වෙනස් කරමින් පාසල් තුළ ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපන රටාවකට යොමු කිරීමට කෙසේ හෝ උත්සාහ කළ යුතු ය. එය 21 වන සියවසට උචිත දරුවෙකු නිර්මාණය කර ගැනීම විෂයෙහි ලා ඉතා ප්‍රයෝජනවත් වේ. එම අභියෝග ජය ගැනීමට විෂයමාලාවන් ඒ සඳහා ගැළපෙන ලෙස සකස් කරමින්, සාම්ප්‍රදායික මතවාද හා සංස්කෘතීන් බැහැර කරමින්,

නිසි ගුරු පුහුණුවක් ලබා දීම, අවශ්‍ය ඉගෙනුම් සම්පත් ලබා දීම ආදිය සිදු කළ යුතු වේ. එයින් වර්තමාන අධ්‍යාපන රටාව ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපන රටාවක් බවට පත් කර ගැනීමට හැකි වනු ඇත.

**සාරාංශය**

නූතන අධ්‍යාපන පද්ධතියේ නව ප්‍රවේශයක් ලෙස ගුරු කේන්ද්‍රීය අධ්‍යාපනය වෙනුවට ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපනය ප්‍රචලිතව ඇත. ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපන ක්‍රමයක මූලික ලක්ෂණ මුලින් ම වෛදික යුගයේ පශ්චිම භාගයට අයත් උපනෂද් දර්ශන තුළ දැකිය හැකි ය. උපනිෂද් යුගයේ ඉහළ ම ඵලය වූ බුදු දහම තුළ ද ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපනයේ ලක්ෂණ විද්‍යමානය. ඉන් පසු ග්‍රීක ශිෂ්ටාචාරය තුළ බිහි වූ සොක්‍රටීස්, ප්ලේටෝ, ඇරිස්ටෝටල් වැනි බටහිර දාර්ශනිකයන්ගේ අධ්‍යාපන චින්තන තුළින් ද ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපන සංකල්පය හඳුන්වා දී ඇත. එහෙත් ඉන් පසු ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපනය සියවස් ගණනාවක් වැසී ගිය අතර පසුකාලීනව 14 වැනි සියවස්වල දී පමණ අපරදිග දාර්ශනිකයන් ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපන ප්‍රවේශයට නැඹුරු වී ඇත. ශිෂ්‍යයා කේන්ද්‍ර කර ගෙන සිසුන්ට ආකර්ශනීය ලෙස, ක්‍රියාකාරකම් පාදකව, සිසු අවශ්‍යතා සලකා බලමින්, ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය දියත් කිරීම ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපනය ලෙස සැලකේ. කෙසේ නමුත් වර්තමාන අධ්‍යාපන රටාව තුළ මෙම ක්‍රමය ප්‍රායෝගිව සිදු කිරීම අභියෝගාත්මක වී ඇති අතර ඒ සඳහා මනා සැලසුමකින් යුතුව අධ්‍යාපනය ක්‍රියාත්මක කළ යුතු වේ. බොහෝ ආයතන මෙන් ම අධ්‍යාපනඥයන් ද ශිෂ්‍ය කේන්ද්‍රීය ඉගෙනීම ප්‍රායෝගිකව ක්‍රියාවට නංවන බව ප්‍රකාශ කරන නමුත් යථාර්ථයේ දී එය එසේ සිදු නොවේ. කෙසේ හෝ අධ්‍යාපනය ශිෂ්‍ය කේන්ද්‍රීයව දියත් කිරීම 21 වන සියවසට උචිත දරුවෙකු ගොඩ නැගීම විෂයෙහි ලා ඉතා වැදගත් වන අතර ශිෂ්‍ය කේන්ද්‍රීය ව කටයුතු කිරීමට අධ්‍යාපනය හා සම්බන්ධ සියලු පාර්ශ්වයන් සූදානම් විය යුතු වේ.

**ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය**

ජාතික අධ්‍යාපන ආයතනය (2010). *අධ්‍යාපන මූලධර්ම හා පාසල් කළමනාකරණය අත්පොත.* මහරගම: ජාතික අධ්‍යාපන ආයතනය.

*ධම්මපදපාළි,* බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා (පුනර් මුද්‍රණ.) 2006. නැදිමාල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

නානායක්කාර, කේ.ඒ.ඩී.සී. (2008). *ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපනය*. බත්තරමුල්ල: අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.

Dahanayake, S.S. (2006). *Implementation of the Philosophical Concept of Student Centred Education at Senior Secondary Level*. A thesis submitted in partial fulfilment of the requirements for the degree of Master of Education, University of Colombo.

Farrant, J.S. (1964). *Principles and Practice of Education*. England: Longman Group Limited.

Gibbs, G. (1995). *Assessing Student Centred Courses*. Oxford: Oxford Centre for Staff Learning and Development.

Green, C. & Harrington, C. (2020). *Student-centered learning: In principle and in practice*. Lansing, MI: Michigan Virtual University. Retrieved date 22.03.2023 from https://michiganvirtual.org/research/publications/student-centered-learning-in- principle-and-in-practice/

Inuwa, A.M. and Yusof N.B.M. (2013). *Parents and Students Perspectives of School Culture Effects on Dropouts and Non-dropouts in Sokoto Metropolis Nigeria*. The International Institute for Science, Technology and Education (IISTE). ISSN 2222-1719 (Paper) ISSN 2222-2863 (Online). www.iiste.org.

Lea, S. J., D. Stephenson, and J. Troy (2003). *Higher Education Students' Attitudes to Student Centred Learning: Beyond 'educational bulimia'*. Studies in Higher Education 28(3), 321–334.

Neill, O.G. and Mcmahon, J. (2005). *Student Centred Learning: WHAT DOES IT MEAN FOR STUDENTS AND LECTURERS?*. Retrieved date 22.03.2023 https://eprints.teachingandlearning.ie/id/eprint/3345/1/O'Neill%20and%20McMahon%202005.pdf

Schweisfurth, Michele (2019). *UNICEF Think Piece Series: Improving Classroom Practice*. UNICEF Eastern and Southern Africa Regional Office, Nairobi. available online at https://www.unicef.org/esaro/EducationThinkPieces_9_ ImprovingClassroomPractice.pdf

Simon, B. (1999). Why no pedagogy in England? In J. Leach and B. Moon (Eds.), *Learners and Pedagogy*. London: Sage Publications.